රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: IAD/ADM/GA21/120KVA/GEN | ඔබේ අංකය / உமதுஇல / Your No: | දිනය / திகதி / Date: 2023.10.05 |

ෆින්කො ටෙක්නොලජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ට්‍රේඩ් ප්‍රමෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
සී ඇන්ඩ් එම් පවර් ටෙක්නොලජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
මෙට්‍රෝපොලිටන් ටෙක්නොලජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
එස්නා අලයිඩ් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

**120KVA විදුලි ජනක යන්ත්‍රය සේවා කිරීම හා නඩත්තු කිරීම සඳහා ලංසු කැඳවීම**

මෙම අමාත්‍යාංශ පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති 120KVA විදුලි ජනක යන්ත්‍රය සේවා හා නඩත්තු කිරීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

2. ලංසු ඉදිරිපත් කිරීමට ප්‍රථම අදාළ කාර්යය පිළිබඳ ස්ථානීය පරික්ෂාවක් සිදු කර අවබෝධය ලබා ගත යුතු අතර, එම කාර්යය සඳහා ඔබට වැය වන කිසිදු මුදලක් අමාත්‍යාංශය මගින් ගෙවනු නොලැබේ.

3. අදාළ කොන්ත්‍රාත්තුව ඔබ වෙත පැවරුවහොත් කාර්යය පවරන ලද දින සිට වර්ෂයක කාලය ඇතුළත සෑම මාස 06 කටම වරක් , ඔබ විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් වලට යටත්ව අදාළ සේවාව සැපයීම සිදුකළ යුතුය.

4. මෙම ලිපියත් සමග යොමු කර ඇති **ඇමුණුම 01** හි ලේඛනය මගින් ලංසු ඉදිරිපත් කිරීම සිදු කළ යුතු අතර එම ලංසු ලේඛනය මගින් ඉල්ලා ඇති අනෙකුත් තොරතුරුද ඔබගේ ලංසුවත් සමග ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.

5. ඔබගේ මිල ගණන් **2023.10.19** වන දින **පෙ.ව.10.00** ට පෙර ඉදිරිපත් කළ යුතු ය. එදින **පෙ.ව.10.00** න් පසුව ඉදිරිපත් කරන කිසිදු ලංසු පතක් භාර ගනු නොලැබේ.

6. ඔබගේ ලංසු මිල ගණන් මුද්‍රා තබන ලද කවර වල බහා කවරවල වම්පස ඉහළ කෙළවරේ **120KVA විදුලි ජනක යන්ත්‍රය සේවා හා නඩත්තු කිරීම - 2023** යනුවෙන් සඳහන් කර **2023.10.19** දින **පෙ.ව.10.00** ට පෙර ලැබෙන පරිදි **ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභ්‍යන්තර පාලන), රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,** නිදහස් චතුරශ්‍රය , කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ යුතු ය.

| | | | |
|---|---|---|---|
| දුරකථන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279 | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk | වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.pubad.gov.lk |

7. ලංසු විවෘත කිරීම **2023.10.19** වන දින **පෙ.ව.10.00** ට අමාත්‍යාංශයේ දෙවන මහලේ පිහිටි අභ්‍යන්තර පාලන අංශයේ දී සිදු කරන අතර, ඒ සඳහා ඔබට හෝ ඔබගේ නියෝජිතයකුට සහභාගි විය හැකි ය **.ඒ සඳහා සහභාගි වන අය තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද ලිපියක් හා ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.**
8. ඉදිරිපත් කරන ලද ලංසු මිල ගණන් පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරීම, අදාළ කාර්යයන් පිළිබඳ අවසාන තීරණය අමාත්‍යාංශය සතු වේ.



සී.පී.යූ.හෙට්ටිආරච්චි
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (අභ්‍යන්තර පාලන)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට

දුරකතන : +94 11 2692633 (දිගුව - 205)
ෆැක්ස් : +94 11 2697299
විද්‍යුත් තැපෑල : sas-ia@pubad.gov.lk

<u>පිටපත</u>

01. සහකාර අධ්‍යක්ෂ, (තොරතුරු තාක්ෂණ) - කරු. උක්ත මිල කැඳවීම වෙබ් පිටුවේ පළ කිරීම සඳහා